චක්‍රලේඛ අංක:- 34/2010

මගේ අංකය:- ඩබ්/පසු/    /2010
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2010/11/23

සියළුම බන්ධනාගාර අධිකාරීන්
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත

## සිරකරුවන්ගේ යැපෙන්නන් සඳහා මහජනාධාර මුදල් ලබාදීම යථාවත් කිරීම

සිරකරු පුනරුත්ථාපන ක්‍රියාවලිය තුල සිරකරුවන්ගේ යැපෙන්නන් සඳහා මහජනාධාර මුදල් ලබාදීමට කටයුතු කිරීම සුභසාධක නිලධාරීන්ගේ සුවිශේෂ වූ රාජකාරියකි. විශේෂයෙන්ම පවුලේ ගෘහමූලිකයා බන්ධනාගාර ගතවූවිට ඔහුගෙන් යැපෙන්නන් පත්වනුයේ මහත්වූ අසරණ තත්වයකටය. ඊට පිළියමක් ලෙස සහ සිරකරු පුනරුත්ථාපන ක්‍රියාවලිය වඩාත් සාර්ථකව පවත්වාගෙන යාමත් අරමුණු කරගෙන මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කර ඇත.

02. වර්තමානයේදී සැම බන්ධනාගාරයකටම සුභසාධක නිළධාරීන් අනුයුක්ත කොට තිබුනද සිරකරු පවුල් සඳහා මහජනාධාර මුදල් ලබාදීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක නොවීම කණගාටුදායක තත්වයකි. මෙම අයහපත් තත්වය ශ්‍රී ලංකා සිරකරු සුභසාධක සංගමයේ මධ්‍යම කමිටු රැස්වීමේ අවස්ථා කිහිපයකදීමත් සාකච්ඡාවට බඳුන් වී ඇත. මහජනාධාර මුදල් ගෙවීමට අවශ්‍ය මූලික මුදල් ශ්‍රී ලංකා සිරකරු සුභසාධක සංගමයේ ප්‍රාදේශීය කමිටු වලට ප්‍රතිපූරණය කල හැකි වුවද මෙම මුදල් ප්‍රයෝජනයට නොගැනීම සිරකරු පවුල් සඳහා කරන මහත්වූ අසාධාරණයකි.

03. එබැවින් මේ සම්බන්ධයෙන් වහාම තම අවධානය යොමු කර ආරම්භක පංති අවස්ථා වලදී මෙන්ම වැඩ අංශ සංචාරයන්හිදී සිරකරුවන්ගේ මෙම අවශ්‍යතාවය හඳුනාගෙන කඩිනමින් ක්‍රියා කරන ලෙසට සුභසාධක නිළධාරීන්ටත්, ඔවුන්ගේ එම රාජකාරී කටයුතු හරියාකාරයෙන් ඉෂ්ට වන්නේද යන්න පෞද්ගලිකව අධීක්ෂණය කරන ලෙසට ජ්‍යෙෂ්ඨ සුභසාධක නිළධාරීන්ටත් නියෝග කෙරෙන අධිකාරී නියෝගයක් නිකුත් කරන ලෙසට මෙයින් උපදෙස් දෙමි. විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ සුභසාධක නිළධාරී විසින් බන්ධනාගාර මූලස්ථානය වෙත එවන සාරාංශ වාර්තාවන්හි වෙනම ශීර්ෂයකින් මේ සම්බන්ධව වාර්තා කලයුතුය.

04. සුභසාධක නිළධාරීන්ගේ පහසුව පිණිස මේ සමඟ ආදර්ශ ආකෘතියක් එවන අතර එය පිටපත් 03 න් යුතුව සම්පූර්ණ කර එහි මුල් පිටපත සිරකරු කොළඹ නගර සභා බල ප්‍රදේශය තුල පදිංචි අයෙක් නම් පුණ්‍ය කොමසාරිස්, කොළඹ මහ නගර සභාව වෙතද පිටස්තර ප්‍රදේශයක පදිංචිකරුවෙක් නම් අදාල ප්‍රාදේශීය ලේකම් වෙතද, පිටපතක් අදාල සිරකරු සුභසාධක සංගම් ප්‍රාදේශීය කමිටුවටද යවා අනෙක් පිටපත ගොනු ගත කරගන්නා ලෙසටත් සුභසාධක නිළධාරීන්ට උපදෙස් දෙන මෙන් දන්වමි.

වී.ආර්.සිල්වා (ආර්එස්පී, යූඑස්පී, එන්ඩියු, අයිපී)
මේජර් ජනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්